


# කැඳ ලබාගැනීමට භාජනයක් රැගෙන පෝලිමේ උන් අම්මා දුටිමි

## සන්නසට සකස් කරන්නේ ශ්‍රීලාල් සෙනෙවිරත්න

යුද්ධයේ අවසන් අදියර වන විට අනෙක් සෙන්පතිවරු පොට්ටු අම්මාන් කෙරෙහි මහත් කෝපයෙන් පසුවන බව ප්‍රකටව පෙනෙන්නට විය. බළඇණිවල දුර්වලතාවන් තේරුම් නොගෙන ඔහු කරන නියෝග බොහෝ දෙනෙකු තුළ කෝපයක් ඇති කර තිබුණි.

අංග හීන බවට පත්වූ සටන්කාමීන් වෙඩි බෙහෙත් සමඟ පුදුකුඩියිරුප්පුව වටා ස්ථානගත කළ යුතුය යන අදහස ඔහු ඉදිරිපත් කර තිබුණි. හමුදාව ඉදිරියට එන විට ඔවුන් පුපුරා යා යුතුය යනුවෙන් ඔහු නියෝග කර තිබුණි. කළු කොටි සාමාජිකයන් බොහෝ දෙනෙක් ක්ලේමෝර් බෝම්බ සමඟ ඉදිරියට ගොස් හමුදාවට එරෙහිව බෝම්බ එල්ල කළ යුතුය යනුවෙන් ද ඔහු පැවසුවේය. ඒ අයුරින්ම සටන්කාමීහු බොහෝ දෙනෙක් සටන් පෙරමුණට ගොස් දිනිය නොහැකි යුද්ධයක නිස්කාරනේ ජීවිතය අහිමි කර ගත්හ. ''දුර්වල ජාතියක බලවත්ම ආයුධය ලෙසින් මම 'කළු කොටින්'ව නිර්මාණය කරමි'' යැයි නායකතුමා වරක් පවසා තිබුණි. කළු කොටි සාමාජිකයන් වාහනයක පුරවන ලද පුපුරන ද්‍රව්‍ය සමඟ පුදුකුඩුයිරුප්පු කේප්පාපිලවු මාර්ගයේ වූ හමුදා මුර කපොල්ලක් විනාශ කිරීම සඳහා ගොස් තම සිරුරු පුපුරුවා ගත්හ. මෙවැනි ප්‍රහාර කිසිවක් හමුදාවේ ඉදිරියට පැමිණීම වැළැක්වීමට හැකි ශක්ති යෙන් යුතු ප්‍රහාර නොවීය. එහෙයින් බොහෝ සටන්කාමීන්ගේ දිවි පිදීම් වටිනාකමින් තොර තත්ත්වයට පත්විය.

සාමය බිඳ වැටී යුද්ධය ඇවිළෙමින් පවතිද්දී සංවිධානයේ චිත්‍රපටි දෙබස් කැවීමේ අංශය දෙබස් කවා 'යුද්ධ විරුවන් තුන් සීයක්' යන චිත්‍රපටිය නායකතුමා හමුවකදී ප්‍රදර්ශනය කෙරුණි. එමෙන්ම 'හිට්ලර්ගේ අවසන් දවස්' වැනි චිත්‍රපටිද දෙබස් කවා සටන්කාමීන් සඳහා ප්‍රදර්ශනය කෙරුණි. විමුක්ති කොටි සංවිධානය නමැති මහත් බලවත් සංවිධානයක් අක්‍රියව යාම සිදුවූ ආකාරය ලෝකය බැලුවේ අවිශ්වාසනීය බවකින් යුතු පුදුමයකින්ය. එහෙත් පරාජය මනසේ මවා ගනිමින් නායකතුමා යුද්ධයෙහි අවසන් අදියර ආරම්භ කළා දෝ යැයි මම බොහෝ වතාවක් සිතුවෙමි. ලක්ෂ සංඛ්‍යාත ජනකායකගේ ලේ සහ කඳුළු සංවිධානයේ වර්ධනය උදෙසා ජීවය ලබා දෙමින් තිබිය දී විමුක්ති කොටි සංවිධානයත් දෙමළ ජනතාව වෙනුවෙන් වූ ආයුධ සන්නද්ධ අරගලයක් තනි පුද්ගලයෙකුගේ රුචි අරුචිකම්වලට පමණක් යටත්වීමත් ඔහුගේ රුචි අරුචිකම් අනුව ගත් තීරණ පදනම් කරගෙන මෙහෙ යවීමත්, ඇති කළේ කොයිතරම් විශාල වාර්ගික විනාශයක් ද?

දෙදහස් නවය වසරේ තෙවෙනි මාසයේ දී පමණ පුදුකුඩුයිරුප්පුහි පිහිටා තිබූ කඳ වුරක වගකීම් බාර සටන්කාමීන් සියලු දෙනා වෙනුවෙන් හමුවක් බුද්ධි අංශයෙහි භාරකරු පොට්ටු අම්මාන් විසින් පවත්වන ලදි. විමුක්ති කොටි සංවිධානයෙහි ඉතාමත් ඉහළ ආරක්ෂක කලාපය ලෙසින් පැවැති පුදුකුඩියිරුප්පු ප්‍රදේශය අනතුරු බහුල රණබිමක් බවට පත්ව තිබුණි. එදින එම හමුව වැඩි වේලාවක් පැවතුණේ නැත. පොට්ටු අම්මාන් විසින් පහත සඳහන් කරුණ ඉතාමත් කෙටියෙන් පවසන ලදි.

''මොකක් හරි ප්‍රාතිහාර්යක් සිද්ධ වුණොත් මිස සංවිධානය ජයග්‍රහණ කරනවා කියන එක තවදුරටත් වලංගු දෙයක් නොවෙයි. සංවිධානයේ ලිපි ලේඛන තියාගෙන ඉන්න අය ඒවා සම්පූර්ණයෙන්ම විනාශ කරන්ඩ. මිනිස්සු හමුදාව ළඟට යන්න පටන් ගන්නවා. අන්තිම අදියරේදි සටන්කාමීන්ටත් මිනිස්සු එක්ක එකතු වෙලා හමුදාව ළඟට යන්ඩ වෙනවා. එතකොට 'ඔතන කොටි ඉන්නවා නම් නැඟිට වරෙල්ලා' කියලා කියයි. ''මං කොටි කියලා නැඟිටින කොට වෙඩි තියලා මරලා දායි. ඒක තමයි සිද්ධ වෙන්නෙ. මේ යුද්දෙ හැර වුම් ලක්ෂයක් ඇති කරන්ඩ නායකත්වය මුළු උත්සාහයම දරනවා. එහෙත් නැවතත් මේ කාරණය පැහැදිලිව තේරුම් ගන්ඩ ඕනෑ. ඒක තමයි ප්‍රාතිහාර්යක් සිද්ධ වුණොත් මිස අපි දිනන එක බොරු. ඔබලාව කලබලයට පත් කරන්ඩ මම මේක කියන්නේ නෑ. ඇත්ත ස්ථාවරය ඒකයි. ඇත්තෙන්ම අද දිනයේ ඔබලාව කැඳෙව්වේ ඔබලා සතුව තිබෙන ලිපි ලේඛන විනාශ කරන්ඩ කියලා කියන්ඩයි.''

ඒ සමඟම හමුව අවසන් විය. තුවාල ලබා සිටින සටන්කාමීන් පිළිබඳව හෝ එසේත් නැත්නම් සංවිධානය සතුව විශ්වාසයෙන් යුතුව සුරැකුම් නිවාසවල සිටින අය ගැන පවා හෝ වචනයක්වත් සාකච්ඡා කෙරුණේ නැත. කෙනෙක් අනෙකා සමඟ කතාබහ කිරීමට පවා සිත් නොවූ මානසික තත්ත්වයක් තුළ සියලු දෙනා විසිරී ගියහ. විමුක්ති කොටි සංවිධානයේ වගකීම් භාරක රුවන්ට පුදුකුඩියිරුප්පුවෙහි පැවැත්වූ අවසාන හමුව එය විය.

පුදුකුඩියිරුප්පු ප්‍රදේශය හමුදාව අත්පත් කරගැනීමෙන් පසුව පුදුකුඩියිරුප්පුවෙහි ආනන්දපුරම් ප්‍රදේශයෙහි දී කොටි සං විධානය ඇතුළු වී කරන ප්‍රහාරයක් එල්ල කළේය. ප්‍රධාන පෙළේ සෙන්පතිවරු බොහෝ දෙනෙක් සහභාගි වූ මෙයට නායකත්වය දුන්නේ සෙන්පති බානුය. දින තුනක් තිස්සේ දිග්ගැස්සුණු මෙම ප්‍රහාරයෙන් ජ්‍යෙෂ්ඨ සෙන්පතිවරු ඇතුළු බොහෝ සටන්කාමීහු ජීවිතක්ෂයට පත් වූහ. සෙන්පති බානු සමඟ සටන් කරමින් ස්වල්ප දෙනෙක් පමණක් ජීවිත බේරාගත්හ. සෙන්පතිවරුන් සහ සෙන්පතිවරියන් වන විදූෂ, දුර්ගා, මණිවණ්ණන්, ගඩාෆි යන අය ද තවත් බොහෝ සටන්කාමීහු ද මෙම ප්‍රහාරයේදි ජීවිතක්ෂයට පත්වූහ. ඔවුන්ගේ සිරුරු මුදාගැනීමට නොහැකිව එම ප්‍රදේශ යේම අත්හැර දැමිණි. තුවාල ලබා සිටි බො හෝ සටන්කාමීන්ව ද එහිම අත්හැර දමා පැමිණි බව ප්‍රහාරයට සම්බන්ධ වූ කිට්ටු කාලතුවක්කු බළකායේ විශේෂ සෙන්පති නවනිධි මා සමඟ පැවසුවේය.

කිලිනොච්චිය අහිමිවීමෙන් පසුව ජනතාව ජීවත් වන ප්‍රදේශ පෙරමුණු සටන් බිම් බවට පත්විය. සංවිධානයේ සියලුම ක්‍රියාකාරකම් ජන සමූහය මැද්දේ සිදු කළේය. අනිවාර්ය බඳවා ගැනීමේ කටයුතු මුල්ලිවයික්කාල් දක්වා ඉතාමත් උග්‍ර ලෙසින් සිදු කෙරිණි. එම ප්‍රදේශයේ තල් රුප්පාවේ මූලික පුහුණුව දුන්නේය. ආයුධය අතට ගෙන ඔසවා කොකා ගැස්සීමට පුළුවන්කම තිබුණොත් ඇති තත්ත්වයෙන් පුහුණු කිරීම් සිදු කෙරිණි. අයුක්ති සහගතව ජීවිත අහිමි කිරීමට හේතුවන මෙවන් ක්‍රියාමාර්ගවලින් කිසිම ප්‍රයෝජනයක් නොමැතිය යන්න දැන දැනම හිතුවක්කාර මානසික තත්ත්වයකින් මෙම සැළසුම් ක්‍රියාත්මක කළේය. මේ නිසා පොදු ජනයාත්, සටන්කාමිනුත් කලකිරීමේ උච්චස්ථානයට පත්වූහ. බොහෝ අත්දැකීම් සහිත සටන්කාමීහු සංවිධානයෙන් ඉවත්ව යන්නට පටන් ගත්හ. තම පවුල් සමඟ ජනතාව අතරේ ගැවසෙමින් සිටි ඔවුන් නැවතත් සංවිධානයේ ක්‍රියාකාරකම් සමඟ එකතු නොවේ නම් මරණ දඬුවම පමුණුවන බව නිවේදනය කෙරුණි. එවැනි සිදුවීමක්, දෙකක් මුහුදු කොටි සටන්කාමීන්ට අත්විය.

විදෙස් දෙමළ ජනයාගේ සංවිධානයෙන් ''වණංගාමණ්'' නම් වූ නැව ජනතාව වෙනුවෙන් සහනාධාර සමඟින් පැමිණෙමින් සිටින උණුසුම් පුවත ''කොටි හඬ'' ජනතා වට දැනුම් දෙමින් සිටියේය. එම අර්බුධකාරී අවස්ථාවේ ''කොටි හඬ'' ගුවන් විදුලිය ජනතාව තුළ විශ්වාසය ඇති කෙරෙන අන්දමේ විවිධ වැඩසටහන් සහ ප්‍රවෘත්ති සපයන්නට විය. රෝගීන් සහ තුවාල වූ ජනතාව රැගෙන යාම සඳහා ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය විසින් සංවිධානය කරනු ලැබූ නැවෙහි යාම සඳහා වන අවසරය කෙසේ හෝ ලබාගෙන පිටවයා යුතුය යන උනන්දුවෙන් ජනතාව පොරකන්නට විය. සටන්කාමීන්ගේ පවුල්වල ළදරුවන්ව ආරක්ෂා සහිතව පිටත්කර හැරිය යුතුය යන අදහසින් ඒ සඳහා වෙ හෙස ගත්හ. මුහුදු මාර්ගයෙන් ද ගොඩබිම් මාර්ගයෙන් ද ජනතාව සංවිධානයට නොදැනෙන ලෙසින් පිටව යමින් උන්නෝය. සංවිධානය තුළින් කොයි තරම් බාධා ඇති කළත්, තුවක්කු ක්‍රියාත්මක කළත් ජනයා සං විධානයෙහි සිටි තම දරුවන්ව සොයාගෙන පිටව යාමට පටන් ගත්හ.

ගර්භාෂයෙහි ඇති වූ ගෙඩියක් හේතුවෙන් මගේ මව ගර්භාෂය ඉවත් කිරීමේ සැත්ක මකට ලක්ව හය මාසයක් ගතවීමට ආසන්නයෙහි කිලිනොච්චියේ කනකපුරය ආසන්නයෙහි පිහිටා තිබූ අපේ නිවෙස අතහැර අවතැන්ව ගොස් සිටියාය. තැනින් තැනට යමින් සිට අවසානයේ කුඩා මල්ලක් අතැතිව තනිවම වට්ටුවාගල් මුහුදු වෙරළේ සිටිනු දුටු බවට මා දන්නා අඳුනන සටන්කාමීහු මා සමඟ පැවසූහ. පුදුමාතලන් ප්‍රදේශයේ දී වරක් මා මුණගැසුණු මගේ මව ''මිනිස්සු යන තැනකට අපිත් යනවා දුවේ. උඹ හැර මට වෙන කිසි කෙනෙක් නෑ.'' යැයි පවසා අඬා වැළපුණාය. මගේ සහෝදර සහෝදරියන්ගේ පවුල්වල අය ඉන්නේ කොහෙද යන්න හෝ ඔවුන්ට සිදුවූයේ කුමක්ද යන්න යන්න හෝ නොදැන උන්නමේ. මුල්ලිවයික්කාල්හි දි අම්මා දුටු මොහොතේ තම කකුල් කටුවලට සීරීමෙන් වූ තුවාල මට පෙන්නුවාය. දේවපුරම් කැලෑ පාරෙන් එද්දී එම තුවාල සිදුවූ බව අම්මා කීවාය. අව්වෙන් මුවාවීමට හිස රෙද්දකින් වසා ගෙන උන් අම්මා කැඳ ලබාගැනීමට ඇලුමිනියම් භාජනයක් රැගෙන පෝලිමේ උන්නාය. රට බේරා ගැනීමට යාමෙන් වැදූ අම්මාගේ අසරණ අනාථභාවයට මම හේතුවක් වූවෙමි යැයි මගේ හිත වේදනා දෙන්නට විය.

RESIDENTIAL DESIGNS, PERMITS DRAWINGS
RANJ DESIGN & DRAFTING SERVICES
RANJITH WANNINAYAKE
- FREE ADVICES
- PLANS–SINGLE/DOUBLE STOREY/ EXTENSIONS/DECKS/CARPORTS
- PLANNING PERMIT DRAWINGS
- BUILDING PERMIT DRAWINGS
REGISTERED Building Practitioner
3/19 Balmain Court, Lalor 3075
Tel: 0430 066 241 Email: designrake@gmail.com